**මුදල් අමාත්‍යාංශයෙහි**

**කම්කරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත**

**බඳවා ගැනීමේ පිරිපාටිය**

01. **සම්බන්ධවන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : අදාල නොවේ : යොමු අංකය: දිනය:

1.2 අමාත්‍යාංශය : මුදල් අමාත්‍යාංශය : යොමු අංකය: MF1/01/06/බ.ගැ./කොන්ත්‍රාත් දිනය: 2016.02.10

1.3 කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරිම : යොමු අංකය: DMS/0063 දිනය: 2016.01.26

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය:EST-2/03/REC/4123 දිනය:2016.02.19

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය :NPC/3/2/SR-1 දිනය:2016.03.03

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය : PSC/EST/05-01-02/02/-2016 දිනය: 2016.04.08

02. **පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද මුදල් අමාත්‍යාංශයේ ලේකම්

03. **පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය** :

ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම හා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහුකාර්ය සේවා ගණයක් ලෙස මෙම සේවා ගණය සැලකේ. මෙම කාර්ය පථයනට අයත් කාර්ය අතුරින් ඕනෑම කාර්යභාරයක් දෙපාර්තමේන්තු ප්‍රධාන / පත්කිරීම් බලධරයා විසින් මෙම සේවා ගණයට අයත් නිලධාරියෙකුට පවරනු ලැබිය හැකිය.

04. **තනතුරේ ස්වභාවය** : මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කළ තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද ලබාගැනීමට හෝ හිමිකම් නොමැති තනතුරකි.

**05.** **මාසික දීමනාව** : මූලික මාසික දීමනාව රු. 14,234/-

මාසික ගැලපුම් දීමනාව රු. 10,006/-

## 06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

6.1 කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු නාම, තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| කම්කරු | 20 | • කාර්යාල පරිශ්‍රය පවිත්‍රව තබා ගැනීම<br>• ලිපි බෙදාහැරීම<br>• කාර්යාල කටයුතුවලදී අවශ්‍ය සංග්‍රහ කටයුතු ඇතුළු අනෙකුත් සූදානම් කිරීම් සම්බන්ධ කටයුතු<br>• අමුත්තන් පැමිණි පසු අදාල මාණ්ඩලික නිලධාරීන් වෙත යොමු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 20

## 07. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ සුදුසුකම් :

**7.1 අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

**7.2 වෘත්තීය සුදුසුකම්** : අදාල නොවේ

**7.3 පළපුරුද්ද** : තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

**7.4 කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයන් යුක්ත විය යුතුය.

**7. 5 වෙනත් සුදුසුකම්** :

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි
2. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.1 සිට 7.5 දක්වා සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

## 8.0 වයස

**8.1 අවම සීමාව** : අවුරුදු 18 ට නොඅඩු

**8.2 උපරිම සීමාව** : අවුරුදු 45 ට නොවැඩි

**9.0** බඳවා ගැනීමේ ක්‍රමය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.

**9.1** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාල නොවේ |
| තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද | 35 | |
| භාෂා හැකියාව හා සන්නිවේදන හැකියාව | 20 | |
| බාහිර ක්‍රියාකාරකම් | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 05 | |
| මුළු ලකුණු | 100 | |

සටහන් :

I. බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේදී ඉහත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කෙරෙනු ඇත.

II. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**9.1.1** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :** මුදල් අමාත්‍යාංශ ලේකම්

**9.2** **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**10.** **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :-** අදාල නොවේ

**11.** **රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන:** අදාල නොවේ.

**12.** **සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.**

**13.** **මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ**

සකස් කළේ : අත්සන : ..............................

පරීක්ෂා කළේ : ..............................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..............................

තනතුර : ..............................

දර්ශනා විජේසිරිවර්ධන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

දිනය : 2016 . 04 . 27 නිලමුද්‍රාව : ..............................

---

යොමු අංකය : MF1/01/06/බ.ගැ./කොන්ත්‍රාත්

මුදල් අමාත්‍යාංශයෙහි කම්කරු තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්

මුදල් අමාත්‍යාංශය

ජේ. ජී. සුමනසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

දිනය : 2016 . 04 . 27 නිලමුද්‍රාව : ..............................

---

යොමු අංකය : PSC/EST/05-01-02/02/2016

මුදල් අමාත්‍යාංශයෙහි කම්කරු තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2016 . 04 . 08 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2016 - 05 - 10 නිලමුද්‍රාව : ..............................

**එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.